# පොළොන්නරු ප්‍රජා නායකයන්ගෙන් නව ආ.ක්‍ර. ව්‍යවස්ථාවට යෝජනාවලියක්

මනම්පිටිය - නිමල් ජයරත්න

**පක්ෂ** මාරු කරන මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධුර අහෝසි කිරීම, අධිකරණයකින් වරදකරුවකු බවට පත්වන මන්ත්‍රීවරුන්ගේ එම ධුරය අහෝසි කිරීම ඇතුළු කරුණු රැසක් මැතිවරණ සංශෝධන පිළිබඳ යෝජනාවන් ලෙස පොළොන්නරුව ප්‍රජා නායකයන් සහ ස්වේච්ඡා සංවිධාන නියෝජිතයන් විසින් ඉදිරිපත් කර ඇති බව පැෆරල් සංවිධානයේ ජාතික සම්බන්ධීකාරක සුජීව ගයනාත් මහතා කීවේය.



ප්‍රජා ක්‍රියාකාරීන් දැනුවත් කරන අයුරු

ඔහු මේ බව සඳහන් කළේ පොළොන්නරුව, බැඳිවැව, රෝයල් නිවාඩු නිකේතනයේ පැවති ප්‍රජා නිලධාරීන්ගේ අදහස් විමසා සිටීමේ හමුවකදීය.

පසුගියදා ඉදිරිපත් කරන ලද මෙම යෝජනා සියල්ල මැතිවරණ ක්‍රමයක් සඳහා වූ පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රියාකාරීත්වය විසින් මෙ මස 19 සහ 20 යන දිනවලදී පොළොන්නරුවට පැමිණෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීම් කමිටුවේ සභාපති ලාල් විජේනායක මහතා ඇතුළු 20 දෙනකුගෙන් යුතු කණ්ඩායමට ඉදිරිපත් කිරීමට නියමිත බවද ගයනාත් මහතා කීවේය.

පාර්ලිමේන්තු නිල කාලය වසර 05 කට සීමා කිරීම, කාන්තා නියෝජනය සියයට තිහ දක්වා වර්ධනය කිරීම, ඡන්ද අපේක්ෂකයා ඔහුට හිමි මැතිවරණ කොට්ඨාසයේ වසර 10ක් පදිංචිව සිටීම ඡන්ද අපේක්ෂකයා සමාජ සේවා වැඩ කටයුතු කර තිබී නියමිත අධ්‍යාපන මට්ටම හා වෘත්තීය සුදුසුකම්, යන එම කරුණු ඇතුළු මැතිවරණ සංශෝධන පිළිබඳ යෝජනාවන් පොළොන්නරු පුරවැසි ක්‍රියාකාරීත්වය විසින් ඒක මතිකව සම්මත කරගෙන තිබෙන බවද ගයනාත් මහතා වැඩි දුරටත් පැවසීය.

මෙම මැතිවරණ සංශෝධන යෝජනාවන් ගැනීමේ අවස්ථාවට නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වයේ ජාතික සම්බන්ධීකාරක, සුජීව ගයනාත්,වැඩසටහන් අධ්‍යක්ෂ ශ්‍රී ධරන් සභානායගම් පොළොන්නරුව සහකාර මැතිවරණ කොමසාරිස් ඉන්දික හතුරුසිංහ, නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ යන මහත්වරු ඇතුළු දිස්ත්‍රික්කයේ ප්‍රජා නායකයෝ ස්වේච්ඡා සංවිධානය නියෝජිතයෝ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීහු මෙන්ම මාධ්‍යවේදීහු රැසක් ද එක්ව සිටියහ.